## 19. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයේ ත්‍රි රාශිය

ඔවුනොවුන්ට ප්‍රත්‍ය වන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි සකල නාමධර්මයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ ය.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන එකුන් අනූ චිත්තයය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

චිත්තජ රූපය, ප්‍රතිසන්ධි කර්මජ රූපය, බාහිර රූපය, ආහාරජ රූපය, ඍතුජ රූපය, අසංඥ සත්ත්ව කර්මජ රූපය, ප්‍රවෘත්ති කර්මජ රූපය යන මොවුහු සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීක ධර්මයෝ ය.

---

**සම්පයුත්තපච්චයො -** සම්පයුත්ත යන්නෙහි 'සං' ශබ්දයේ සම යන අර්ථය ඇත. 'ප' ශබ්දයේ ප්‍රකාර යන අර්ථය ඇත. ප්‍රකාර නම් චෛතසික කාණ්ඩයේ දැක්වූ ඒකෝත්පාදදී ප්‍රකාරයෝ ය. 'සං' ශබ්දයේ සම අර්ථය, චතුමධුර මිශ්‍රකර ඇති ආකාරය මෙන් දතයුතුය. ගිතෙල්, මී පැණි, සකුරු, තෙල් යන වර්ග සතර මිශ්‍ර කොට සමවන තරම් පිසූ කල්හි මෙය ගිතෙල් රසය ය, මෙය මීපැණි රසය ය, මෙය සකුරු රසය ය, මෙය තෙල් රසය ය යැයි බෙදා වෙන් කොට දැක්වීමට නොහැකි වන තරම් සම වන්නා සේ, ඒ නාමස්කන්ධයෝ සතරදෙනා ද එක්ව යෙදෙනා කල්හි මෙය විඤ්ඤාණස්කන්ධය ය, මෙය වේදනාස්කන්ධය ය යනාදී වශයෙන් බෙදා ගෙන දැනගැනීමට නොහැකි තරම් සමව පවතිත් යැයි ඉන් අදහස් වේ. එබැවින් "නාමස්කන්ධ සතර ඒකොත්පාදදී ප්‍රකාරයන්ගෙන් සමව යෙදෙනා කල්හි එකිනෙකට ප්‍රතිපක්ෂ නොවී එක් ස්වභාවයක් තවත් ස්වභාවයක් අනුව ගොස් මිශ්‍ර වන්නා වූ ශක්තිය සම්ප්‍රයුක්ත ශක්තිය වේ" යැයි දතයුතු. ("ඔවුනොවුන්ට ප්‍රත්‍ය වන" සහ "ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන" යන්නෙහි අදහස සහජාත ප්‍රත්‍යයේදී කී අයුරින් ගතයුතු වේ.)

**ප්‍රත්‍ය - ප්‍රත්‍යයෝත්පන්න -** ලෝභ මූල පළමු සිත, චෛතසික යන සතර නාමස්කන්ධ පහළ වනවිටදී විඤ්ඤාණස්කන්ධය ප්‍රත්‍යය වේ. චෛතසික ස්කන්ධ තුන ප්‍රත්‍යයෝත්පන්න වේ. වේදනාස්කන්ධය ප්‍රත්‍යය වේ. සෙසු ස්කන්ධ තුන ප්‍රත්‍යයෝත්පන්න වේ. ස්කන්ධ තුනක් ප්‍රත්‍යය වේ. සෙසු ස්කන්ධය ප්‍රත්‍යෝත්පන්න වේ. ස්කන්ධ දෙකක් ප්‍රත්‍යය වේ. සෙසු ස්කන්ධ දෙක ප්‍රත්‍යෝත්පන්න වේ ය යන ක්‍රමයට අර්හත් ඵල සිත දක්වා දතයුතු වේ. රූප ධර්මයන්හි

ඒකෝත්පාදදී ලක්ෂණ සතර සමඟ නොසැසඳෙන බැවින් ප්‍රත්‍යනීකයන්හි ඇතුලත් කොට ඇත.